# <u>ක්‍රියාකාරකම් පත්‍රිකාව සඳහා පිළිතුරු</u>

1.ශ්‍රී ලංකාවේ මුල්ම විධිමත් ජන සංගණනය පැවැත්වූයේ කුමන වර්ෂයේද? - 1871

2.දකුණු ආසියාතික රටවල ජන සංඛ්‍යාව ආශ්‍රිත ජන ඝනත්වය අනුව පෙළ ගස්වන්න.

| | රට | ජන ඝනත්වය(වර්ග කි.මී.1 ට) |
|---|---|---|
| 1. | මාල දිවයින | 1156 |
| 2. | බංග්ලා දේශය | 1087 |
| 3. | ඉන්දියාව | 381 |
| 4. | ශ්‍රී ලංකාව | 324 |
| 5. | පකිස්ථානය | 229 |
| 6. | නේපාලය | 189 |
| 7. | භූතානය | 16 |

3. රටක ජන සංඛ්‍යා වර්ධනය යන්න හඳුන්වන්න.

නිශ්චිත භූමි ප්‍රමාණයක සිටින ජන සංඛ්‍යාවේ වැඩිවීම යි.

4. ක්‍රි.ව. 2012 දක්වා පසුගිය වසරවල ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා වර්ධනය අධික වී ඇති වර්ෂ සහ

ප්‍රමාණයන් දක්වන්න.

1953 - 2.8

1963 - 2.6

1971 - 2.2

5. වසර 2012 වන විට ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා වර්ධන අනුපාතිකය අඩු වීමට හේතු දක්වන්න.

1.ස්වාභාවික වර්ධනය පහල බැසීම

2. රටින් පිටතට සිදුවන සංක්‍රමණ

3. උපත් අනුපාතිකය පහළ බැසීම.

6. ශ්‍රී ලංකාවේ අඩු ජන සංඛ්‍යා වර්ධනයක් ඇති දිස්ත්‍රික්ක 5 ක් දක්වන්න.

කිලිනොච්චිය ,මොණරාගල, මුලතිව්,වව්නියාව, මන්නාරම

7. කළුතර සහ ගම්පහ දිස්ත්‍රික්කවල ජන සංඛ්‍යා වර්ධන වේගය ඉහළ අගයක් ගැනීමට හේතු 3 ක්

ලියන්න. වාණිජ හා පරිපාලන කටයුතු ඒකරාශී වී තිබීම,සේවා බහුලව පැවතීම,නිදහස් වෙළඳ කලාප වලට සිදුවූ සංක්‍රමණ

8. ජන සංඛ්‍යාවේ අසමාන ව්‍යාප්තියට හේතු 4 ක් දක්වන්න.

| වාර්ගික ජන සංයුතිය | ආගම් අනුව ජන සංඛ්‍යාව |
|---|---|
| සිංහල - 74.9% | බෞද්ධ 70.2% |
| ශ්‍රී ලංකා දෙමළ - 11.2% | ඉස්ලාම් 12.6% |
| ඉන්දියානු දෙමළ - 4.2% | හින්දු 9.7% |
| මුස්ලිම් - 9.2% | රෝමානු කතෝලික - 7.6% |
| අනෙකුත් - 0.5% | අනෙකුත් - 0.1% |

විෂමතාවය, නගර කරා ණය,

හා පරිපාලන ඒකරාශී වීම,දේශගු වෙළදාම.

9. ජන සංඛ්‍යා ව්‍යාප්තිය අනුව ග්‍රාමීය, නාගරික සහ වතු ජන සංඛ්‍යා ප්‍රමාණයේ ප්‍රතිශතයන් දක්වන්න.

| | |
|---|---|
| ග්‍රාමීය | - 77.3% |
| නාගරික | - 18.3% |
| වත | - |

10. ශ්‍රී ලංකාවේ වාර්ගික ජන සංයුතිය සහ ආගම් අනුව ජන සංඛ්‍යාව ප්‍රමාණාත්මක වශයෙන් වෙන

වෙනම දක්වන්න.

11.ජන සංඛ්‍යාව වියපත්වීම යනු කුමක්ද? - අවුරුදු 59 ට වැඩි වූ, වැඩිමහල් යැපෙන්නන්ගේ ජන සංඛ්‍යාව

වැඩිවීම යි.

12. ජන සංඛ්‍යාව වියපත්වීම නිසා රටකට මුහුණ පෑමට සිදුවන ගැටළු 3 ක් දක්වන්න. - ශ්‍රම බලකාය අඩු

වීම,සුබ සාදන වියදම් අධික වීම, ජාතික ආදායම යැපෙන්නන් සඳහා වැය කිරීමට සිදුවීම.

13. වයස් කාණ්ඩ අනුව ජන සංඛ්‍යාව ප්‍රමාණාත්මක වශයෙන් දක්වන්න.

අවුරුදු 15 ට අඩු - 25.8%

අවුරුදු 15 – 59 ත් අතර - 62.0%

අවුරුදු 60 ට වැඩි - 25.8%

14. ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා ව්‍යුහය ආශ්‍රිත සුවිශේෂී ලක්ෂණ 4 ක් දක්වන්න. - බාල වයස් කාණ්ඩවල ජන

සංඛ්‍යාව අඩු වෙමින් පැවතීම,වියපත් කාණ්ඩ වැඩිවීම,ශ්‍රම බලකාය අඩුවීම,ස්ත්‍රී ප්‍රතිශතය ඉහළ යාම.

15. රටක පුම්තිරි අනුපාතිකය අධ්‍යයනය කිරීම තුළින් අනාවරණය කරගත හැකි තොරතුරු 4 ක්

දක්වන්න.

- අනාගත ජන සංඛ්‍යාවේ ස්වභාවය
- යැපෙන්නන් සංඛ්‍යාව
- ප්‍රජනන වයසේ පසුවන ස්ත්‍රීන් සංඛ්‍යාව
- සංවර්ධනයේ දිශානති